# කඩුගන්නාව දුම්රිය ස්ථානය ආශ්‍රිත කාර්මික පුරාවිද්‍යා උරුමය

ආර්.එම්.යූ.එන්. රත්නායක

පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
Sanurathna123@gmail.com

**මුඛ්‍ය පද -** කඩුගන්නාව දුම්රිය ස්ථානය, කාර්මික උරුමය, ශ්‍රී ලංකාවේ දුම්රිය ඉතිහාස

**හැඳින්වීම**

බ්‍රිතාන්‍යය යටත් විජිතයක් බවට පත් වූ ශ්‍රී ලංකාවේ වතු වගාව ආශ්‍රිත ව කාර්මික විප්ලවය හේතු කොටගෙන විවිධ අංශයන් රැසක් දියුණුවට පත්විය. ඒ අතර ප්‍රවාහන ක්ෂේත්‍රය ප්‍රධාන ස්ථානයක් ගනී. කෝපි වගා කටයුතු උඩරට ප්‍රදේශවල ආරම්භ වීමත් සමග ඇතිවුණ පරිවහන අපහසුතා හේතුවෙන් මුල් වරට වතු වගාවන් සිදුකරන උඩරට ප්‍රදේශ කරා මහාමාර්ග පද්ධතියක් සේම දුම්රිය මාර්ගයක් ඉදිකිරීමට මුල පිරිය. එම හේතුව නිසා කොළඹ කොටුවේ සිට මහනුවර, බදුල්ල හා මාතලේ දක්වා වතු අස්වනු ලබාගැනීමේ අරමුණින් හා ප්‍රවාහන සඳහා දුම්රිය මාර්ග ක්‍රම ක්‍රමයෙන් දියුණුවත් සමග ඉදිකරන ලද දුම්රිය මාර්ගයක් ලෙස කඩුගන්නාව දුම්රිය ස්ථානය හඳුන්වාදිය හැකිය. බ්‍රිතාන්‍යය පාලන සමය සිහිගන්වන ලෙස උරුම රැසක් ශේෂ ව ඇති ස්ථානයක් ලෙස මෙහි වැදගත්කම පෙන්වාදීම අරමුණ වේ. කාර්මික පුරාවිද්‍යා උරුමයක් ලෙස මෙම ස්ථානය නිසි අයුරින් සංරක්ෂණය වන්නේ ද යන්න මෙහි මතුවන ගැටළුවකි.

**ක්‍රමවේදය**

සාහිත්‍යය මූලාශ්‍ර, අන්තර්ජාලය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමයේ දී අවට ගම්වැසියන්ගෙන් සහ ස්ථානාධිපතිතුමා සමග සාකච්ඡා කර තොරතුරු එක් රැස් කර ලබාගන්නා ලද දත්ත උපයෝගී කරගෙන මෙම අධ්‍යයනය සිදුකරන ලදී.

**සාකච්ඡාව**

ක්‍රි.ව. 1867 වර්ෂයේ මාර්තු මස 20වන දින ආරම්භ කර ඇති මෙම දුම්රිය ස්ථානය බ්‍රිතාන්‍යය වාස්තු විද්‍යාවට අනුව නිර්මාණය කරන ලද්දකි. එම ගොඩනැගිල්ල ගල්වලින් සකස් කර ඇත. "කඩුගන්නාව ප්‍රදේශයේ බ්‍රිතාන්‍යයන් නවාතැන් ගත් ස්ථානයක් බවට එහි ඇති බංගලා සමූහය, දුම්රිය එන්ජිම සඳහා ජල පහසුකම් ලබාගත් ජල තටාක, ජල පයිප්ප, ජල නළ පද්ධතිය, දුම්රිය එන්ජින් නඩත්තුව, හැරවුම් කටයුතු හා ගාල්කර තැබීම සඳහා වූ පැරණි දුම්රිය ධාවනාගාරය හා දුම්රිය ස්ථානය තුළින් මගීන්ට පහසුවට ගමන් කළ හැකි ගුවන් පාලම, පැරණි දුම්රිය ස්ථානය, පැරණි ගබඩා ගොඩනැගිල්ල, සංඥා කුළුණ, පැරණි බ්‍රේක් වේට්ස් යකඩ බෝල, පැරණි ආලෝක ලාම්පු, ගොවිපල ගේට්ටුව හා පැරණි ජංගම මුදල් පෙට්ටිය" (Ceylon,2017,facebook.com) ආදි පුරාවිද්‍යා උරුමයන් මඟින් අනාවරණය කරගත හැකිය.

ක්‍රි.ව. 1947 දී මෙහි ජනෙල් සඳහා ආරුක්කු සකස් කර ඇති බව පෙනේ. පැරණි ගබඩා ගොඩනැගිල්ල දුම්රිය ස්ථානය ඉදිකරනු ලැබූ මුල් යුගයේ සිට පැවති බවට සාධක පවතී (ජයසිංහ,2020:01). කඩුගන්නාව අවට ප්‍රදේශ කෝපි හා තේ වගාවන් සිදුකරනු ලැබූ ප්‍රදේශ බැවින් කොළඹ වරායට අස්වනු ගෙනයාම සඳහා ගබඩාවක් ලෙස ද මෙම ස්ථානය භාවිතා කර ඇත. කළුගල් සහ කබොක් ගල් මාධ්‍යය කොට ගනිමින් ගොඩනැගිල්ල නිර්මාණය කොට ඇත.

මෙහි පවතින සංඥා කුළුණු පද්ධතිය ඉදිකර ඇත්තේ ලන්ඩන් සමාගමක් විසින් ලීවර්පූර් මාර්ගයේ භාවිතා වූ පැති සංඥා ක්‍රමය පදනම් කරගනිමිනි. මෙම ස්ථානය තුළ බ්‍රිතාන්‍ය නිළධාරීන්ට නවාතැන් ගැනීමට බංගලා කිහිපයක් ඉදිකර ඇති අතර ඒවා පැරණි කාර්මික

ක්‍රම ශිල්පවලට අනුව ගොඩනගා ඇත (ජයසිංහ,2020:01). බ්‍රිතාන්‍යය වාස්තු විද්‍යාව යටතේ ඉදිවුණ මෙහි ඉදිරිපස වෘත්තාකාර කුළුණුවලින් හා දිගු ආලින්දයකින් සමන්විත විය. කළුගල් සහ කබොක් ගල් මාධ්‍යය ලෙස යොදාගෙන බිත්ති ගොඩනගා ඇති අතර බංගලාව ඉහළටවන්නට වෘත්තාකාර කවුළු දෙකක් දක්නට ලැබේ.

කාර්මික පුරාවිද්‍යාත්මක වැදගත්කමක් පෙන්නුම් කරන අතහැර දමන ලද පැරණි දුම්රිය ධාවනාගාරය සුවිශේෂී ස්ථානයක් උසුලනු ලබයි. මෙම ස්ථානයේ සිට ධාවනාගාරය වෙත එන්ජිම නඩත්තුවට සහ ගාල් කර තැබීමට දුම්රිය එන්ජිම ගමන් කළ මාර්ගයේ අවශේෂ අදටත් තැනින් තැන පුරාවිද්‍යාත්මක ශේෂ ලෙස පවතී. මෙම ගොඩනැගිල්ල කළුගල් යොදාගෙන නිමවන ලද්දකි. දුම්රිය ස්ථානයේ සිට ධාවනාගාරය වෙත යන එන්ජින් සහ කඩුගන්නාව දක්වා ධාවනය වූ එන්ජින්වල හැරවුම් කටයුතු සිදුකිරීම සඳහා දුම්රිය එන්ජින් සහ මැදිරි හැරවුම් පිඨිකාවක් අතීතයේ දී තිබී ඇත. මෙම පිඨිකාව අඩි 45ක් පමණ දික් වන අතර එංගලන්ත සමාගමක් විසින් කාර්මික ක්‍රම ශිල්ප යොදාගනිමින් ඉදිකර ඇත.

පුරාණ වැදගත්කමක් සහිත ජල ස්ථම්භ දෙකක් මෙහි දැකගත හැකි ය. ඩීසල් දුම්රිය ධාවනයට ප්‍රථම භාවිතයට ගන්නා ලද වාෂ්ප එන්ජින් සඳහා ජල පහසුකම් ලබාදීමට ජල ස්ථම්භ යොදාගන්නට ඇති බව හමුවන සාධක මඟින් පැහැදිලි කරගත හැකි ය. වාත්තු යකඩ යොදාගෙන නිර්මාණය කරන ලද මෙම ජල සැපයුම්වලට ජලය සපයා ගනු ලැබුවේ කඩුගන්නාවේ ඉහළ කඳු ප්‍රදේශයන්හි පවතින ළිංවල සිට පැමිණෙන ජල නළ පද්ධතිය මඟිනි. වාෂ්ප බල දුම්රිය ධාවනය කිරිම සඳහා අවශ්‍ය ජල පහසුකම ලබාදීමට අවශ්‍ය වූ ජල පයිප්ප පද්ධතියක් තිබූ බව දැකගත හැකි ය. කඩුගන්නාව දුම්රිය ස්ථානයේ වේදිකා අතර මගීන් සඳහා එහා මෙහා ගමන් කරීමේ පහසුව සඳහා යකඩ මාධ්‍යය ලෙස යොදාගෙන ඉදිකරන ලද හෝව් කාප්ප සහිත මගී ගුවන් පාලම් දෙකක් දක්නට ලැබේ. එංගලන්තයේ සමාගමක් මඟින් ගොඩනගා ඇති මෙම පාලම වර්තමානය තුළ පුරාවිද්‍යාත්මක නටබුන් ලෙස ශේෂ ව පවතී.

කඩුගන්නාව දුම්රිය ස්ථානය අසළින් වැටී ඇති කඩුගන්නාව - පොත්තපිටිය හා බලන මාර්ගය හරහා හරස් මාර්ගයේ ගමන් කරන විට දක්නට ලැබෙන ගේට්ටුව සුවිශේෂී පුරාවිද්‍යාත්මක අංගයක් ලෙස පෙන්වාදිය හැකි ය. ගේට්ටුව ක්‍රියාත්මක වන්නේ පාලක මැදිරිය තුළ පවතින්නා වූ සංඥා කුළුණු පද්ධතිය මඟිනි. "ක්‍රි.ව. 1873 වර්ෂයේ ස්ථාපිත කරන ලද ටෙලිග්‍රාෆ් පණිවිඩ හුවමාරු ක්‍රමය, ක්‍රි.ව. 1839 වර්ෂයේ ආරම්භ වූ පැති සංඥා ක්‍රමයේ අවශේෂ අදටත් ශේෂ ව පවතින අතර ටැබ්ලට් ක්‍රමය හරහා ඉදිකරනු ලැබූ සැමපෝ පැරණි සංඥා ක්‍රමය" (ජයසිංහ,2020:01). වර්තමානයේ පවා භාවිතයට ගන්නා අතර මෙම පැරණි අවශේෂ තුළින් පෙනීයන්නේ කඩුගන්නාව දුම්රිය ස්ථානය කාර්මික උරුමයන් රැසක් ශේෂ ව පවතින ස්ථානයක් බවයි.

**ආශ්‍රිත මූලාශ්‍රය**

ජයසිංහ විශ්ව ශ්‍රී , ***කාර්මික පුරාවිද්‍යා උරුමය*** 01, https://m.facebook.com, Access Date 2023.06.12

***කඩුගන්නාව දුම්රිය ස්ථානය***, https://wikipedia.lk , Access Date 2023.06.13

Ceylon R.F, ***රඹුක්කන කඩුගන්නාව දුම්රිය මාර්ගය***, https://m.facebook.com, Access Date 2023.06.13